# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2024 ජූනි

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2024 ජූනි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 2.4%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2024 මැයි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 1.6%ක් ලෙස වාර්තා විය. 2024 ජූනි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 0.8% ක හා ආහාර නොවන කාණ්ඩයේ 1.5%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2024 මැයි මාසයේදී 0.5% සිට 2024 ජූනි මාසයේ 1.9% දක්වා වැඩි වී ඇති අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2024 මැයි මාසයේදී 2.4% සිට 2024 ජූනි මාසයේදී 2.7% දක්වා වැඩි වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කළ විට, 2024 මැයි මාසයේ 206.3ක් වූ දර්ශකාංකය, 2024 ජූනි මාසයේ දී 208.1 ක් දක්වා වැඩි වී ඇති බව වාර්තා විය. මෙමගින් 2024 මැයි මාසයට සාපේක්ෂව 2024 ජූනි මාසයේ දර්ශකාංකය 1.8ක වැඩිවීමක් එනම් 0.84 ක ප්‍රතිශතාංක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම මාසික වෙනස්වීම සඳහා ආහාර කාණ්ඩය 1.04% කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩය 0.20% කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට මිලෙහි වැඩිවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත්තේ එළවළු, අලුත් මාළු, දෙහි, රතු ළූණු, අර්තාපල්, සහල්, පොල් තෙල්, පොල්, සීනි, ඉගුරු, බිත්තර, තේ කුඩු/කොළ සහ කහ කුඩු යන ආහාර ද්‍රව්‍යවල වේ. එහෙත්, ලොකු ළූණු, අලුත් පළතුරු, කිරිපිටි, කුකුලු මස්, මිරිස් කුඩු, කරවල, ටින්මාළු, මුං ඇට, අමුමිරිස් සහ කඩල යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කළ විට, 2024 ජූනි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය අඩුවීම සඳහා ‘ප්‍රවාහන’(*පෙට්‍රල් සහ ඩීසල්*), ‘නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන'(*එල්.පී ගෑස් සහ භූමිතෙල්*) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙත්, 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', ‘විනෝදාත්මක සහ සංස්කෘතික’ සහ ‘ආපන ශාලා සහ හෝටල්’ යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත. තවද, ‘රෙදිපිළි සහ පාවහන්’ සහ‘සංනිවේදන’ යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු අඩුවිමක් වාර්තා වී ඇත. එහෙත්, ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ සහ මත්ද්‍රව්‍ය’ සහ ‘විවිධ භාණ්ඩ සහ සේවා’ යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. තවදුරටත් සළකා බැලීමේදී, ‘සෞඛ්‍ය’ සහ ‘අධ්‍යාපන’ යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල ජූනි මාසය පුරා නොවෙනස්ව පැවති බවත් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පාද වර්ෂය: 2021=100) ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2024 මැයි මාසයේ 3.1% සිට 2024 ජූනි මාසයේදී 3.9% දක්වා වැඩිවීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2023** | ජූනි | 203.3 | 228.4 | 187.1 | 186.5 | 0.1 | -0.7 | 10.8 | 2.5 | 18.3 | 11.3 |
| | ජූලි | 201.9 | 227.5 | 185.3 | 188.0 | -0.7 | 0.8 | 4.6 | -2.5 | 10.9 | 6.3 |
| | අගෝ. | 201.9 | 224.6 | 187.3 | 188.7 | 0.0 | 0.4 | 2.1 | -5.4 | 9.0 | 4.1 |
| | සැප්. | 203.5 | 226.7 | 188.5 | 189.0 | 0.8 | 0.2 | 0.8 | -5.2 | 5.9 | 1.7 |
| | ඔක්. | 203.6 | 224.1 | 190.4 | 189.2 | 0.0 | 0.1 | 1.0 | -5.2 | 6.3 | 0.6 |
| | නොවැ. | 206.0 | 228.1 | 191.8 | 189.3 | 1.2 | 0.1 | 2.8 | -2.2 | 7.1 | 0.8 |
| | දෙසැ. | 208.8 | 236.2 | 191.2 | 189.7 | 1.4 | 0.2 | 4.2 | 1.6 | 6.3 | 0.9 |
| **2024** | ජන. | 215.0 | 242.4 | 197.3 | 193.9 | 3.0 | 2.2 | 6.5 | 4.1 | 8.5 | 2.2 |
| | පෙබ. | 214.5 | 239.5 | 198.3 | 194.6 | -0.2 | 0.4 | 5.1 | 5.0 | 5.1 | 2.7 |
| | මාර්තු | 210.0 | 234.4 | 194.3 | 194.5 | -2.1 | -0.1 | 2.5 | 5.0 | 0.7 | 3.4 |
| | අප්‍රේල් | 208.2 | 231.1 | 193.4 | 193.9 | -0.9 | -0.3 | 2.7 | 3.3 | 2.3 | 3.0 |
| | මැයි | 206.3 | 227.3 | 192.8 | 193.6 | -0.9 | -0.2 | 1.6 | 0.5 | 2.4 | 3.1 |
| | ජූනි | 208.1 | 232.8 | 192.1 | 193.7 | 0.9 | 0.1 | 2.4 | 1.9 | 2.7 | 3.9 |